# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 158 — 1975 අප්‍රේල් 04 වැනි සිකුරාද — 1975.04.04

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 233 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 234 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... | 236 |
| මිළ පාලන දැන්වීම ... | 240 |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම ... | — |
| ආදායම් සහ වියදම් පිළිබඳ වාර්තා ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 240 |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... | — |


## ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය

1975 අංක 162

අංකය : ඩී21/ආර්ඊසීඊ/763.

යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරයෙන් ඉල්ලා අස්වීමක්

1975 අප්‍රේල් මස 01 දින සිට, යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා ගේ අධිකාරයෙන් ඉල්ලා අස්වීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන ඇත :—

'ලුතිනන් කර්නල් දේවමුල්ලගේ දේවප්‍රිය තිලක් පෙරේරා, ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1975 මාර්තු මස 25 දින,
කොළඹ දිය.

4-104—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

1975 අංක 163

අංකය : ඩී/වීඑප්/62 බී.

යුද්ධ හමුදාව—ශ්‍රී ලං සෙව බ—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ද්විතීයනයක් අවසන් කිරීම

ශ්‍රී ලංකා සෙවච්ඡා බලසේනාවේ පහත සඳහන් නිලධාරියාගේ නිත්‍ය බල සේනාවේ සේවය සඳහා කල ද්විතීයනය, 1975 මාර්තු මස 31 වෙනි දින සිට අවසන් කර ඇත.

කපිතාන් නෝමන් ඇලන් ස්මිත්., ජාසේරෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1975 මාර්තු 20 දින,
කොළඹ දී ය.

4-1—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා, ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1974 ජනවාරි මස 1 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

233—බී 71657—10,480 (04/75)

# වෙනත් පත් කිරීම් ආදිය

### 1975 අංක 164

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

කොළඹ 5, ෆිසිෆිජ් පාර, අංක 49/1 ඒ හි මොහමඩ් කරීම් මොහමඩ් හම්සා මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/15—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### 1975 අංක 165

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

දූනගහ, පල්ලියපිටිය පදිංචි රත්පටි දේවගේ අනුලා ඉන්ද්‍රසිරි මෙනවිය මීගමුව ද කෘස් පාරේ අංක 23 හි ප්‍රධාන කාර්යාලය ද පල්ලියපිටියේ අංක 140 හි අතුරු කාර්යාලය ද ඇතුව මීගමුව අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/10—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### 1975 අංක 166

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

මූණසිංහ ආරච්චිල්ලාගේ රොබට් මූණසිංහ මහතා යටියන්තොට ප්‍රධාන කාර්යාලය ද කිතුල්ගල අතුරු කාර්යාලය ද ඇතුව අවිස්සාවේල්ල අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/9—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### 1975 අංක 167

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

දකුණු කළුතර, මහහීනටියන්ගල පදිංචි මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/16—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### 1975 අංක 168

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

අළුත්ගම, ගාලුපාර, "විරතිරි" හි පදිංචි දුනුසිංහ ඊවින් ද සිල්වා, මහතා බේරුවල, කෙළින් වීදියේ කාර්යාලය ද ඇතුව කළුතර අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/11—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය.

---

### 1975 අංක 169

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

දකුණු කළුතර, ගඟබඩ පාර අංක 16හි පදිංචි යස්මන් සාවිත්‍රි රාම සුන්දර විවාහයට පෙර ද සොයිසා මහත්මිය කළුතර අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/17—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### 1975 අංක 170

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

දවුන්ඩසේකර මුදියන්සේලාගේ දීගල ගෙදර ඩිංගිරිබණ්ඩා දීගල මහතා ගෙළිඔය වී. සී. අංක 12 බී හි ප්‍රධාන කාර්යාලය ඇතුව මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/13—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### 1975 අංක 171

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

කුරුල්ලන්මඩුවේ ගෙදර සිරිසේන මහතා හැන්නේකුඹුරේ අංක 167/5 හි වාසස්ථානය සහ කාර්යාලය ද ඇතුව මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/8—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

## 1975 අංක 172

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

වතිගසූරිය මුදියන්සේලාගේ දෝන තුංගභද්‍රා පද්ම කුමාරි වතිගසූරිය මහත්මිය මොරගොල්ලාගම ප්‍රධාන කාර්යාලය ද මහ ඇඹෝගම අතුරු කාර්යාලය ද ඇතුව මාහෝ අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/14—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## 1975 අංක 173

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය

වත්තාවල, හප්පාවන, කොස්දූව හි පදිංචි කල්‍යානත් ද තිරණගම මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/3—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## 1975 අංක 174

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

අම්බලම්ගොඩ විල්මට් ප්‍රේමතුංග මහතා පරගහතොට ප්‍රධාන කාර්යාලය ද වතුගෙදර අතුරු කාර්යාලය ද ඇතුව බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/7—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## 1975 අංක 175

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ඇල්පිටියෙහි හඳුන්නෙත්ති රෝලන්ඩ් ද සිල්වා මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/2—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## 1975 අංක 176

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

තන්දාස හේවා බැද්දගේ මහතා වැලිගම, හෙට්ටිවීදියේ ප්‍රධාන කාර්යාලය ද මාතර අතුරු කාර්යාලය ද ඇතුව මාතර අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/6—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## 1975 අංක 177

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

මල්ලාකම්හි රත්නසින්ගම් ජෝෂප් සෙල්වරත්නම් මහතා මල්ලාකම් අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/1—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## 1975 අංක 178

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

රෝහාන් පාලිත සුබසිංහ මහතා කෑගල්ල ප්‍රධාන කාර්යාලය ඇතුව කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/12—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

## 1975 අංක 179

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කිරිබණ්ඩාර විජයසුන්දර මහතා කෑගල්ල ප්‍රධාන කාර්යාලය ද ඇතුව කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4-101/5—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

# ආණ්ඩුවේ නිවේදන

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

බදුල්ල අධිකරණ දිස්ත්‍රික්කය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් බදුල්ල, මහියංගන පාර, අංක 56එ් හි පදිංචි බාලසිංහම් බාලරූමන් මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

ඩී. ඩී. අයි. පී. එස්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දී ය.

4–101/4—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී—බී. 7/63

### 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත 6(1) (v) වගන්තිය යටතේ නියමය

1968 අංක 26 දරන පනතින් සංශෝධිත, 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 6(1) (v) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය අනුව, ඉහත කී වගන්තිය මෙහි උපලේඛනයේ විස්තර කොට ඇති ව්‍යාපාරයට අදාළ විය යුතු යයි ප්‍රකාශ කරමි.

එන්. එම්. පෙරේරා,
මුදල් ඇමති.

1975 මාර්තු මස 21 දින,
කොළඹ දීය.

#### උපලේඛනය

සීමාසහිත යාල සෆාරි බීච් හෝටලය විසින් පවත්වාගෙන යනු ලබන යාල සෆාරි බීච් හෝටලය.

4–72/1—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී—බී. 7/63

### 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත 6(1) (vi) වගන්තිය යටතේ නියමය

1968 අංක 26 දරන පනතින් සංශෝධිත, 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 6(1) (vi) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය අනුව, මෙම නියමය මගින්, ඉහතකී පනතේ 6 වන වගන්තියේ (1) වැනි උප වගන්තියේ (v) වැනි ඡේදයෙහි සඳහන් ව්‍යාපාරයක් වන සීමාසහිත යාල සෆාරි බීච් හෝටලයේ ප්‍රයෝජනය සඳහා ගොඩනැගිලි සපයනු පිණිස වූ සීමාසහිත එන්. වෛත්‍යලිංගම් සහ සමාගම විසින් යාල පලාතුපාන පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරය අනුමත කරමි.

එන්. එම්. පෙරේරා,
මුදල් ඇමති.

1975 මාර්තු මස 21 දින,
කොළඹ දීය.

4–72/2—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

ආඥා අංකය : 42.

### වර්ෂ 1969 යේ අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත 57 වන වගන්තිය යටතේ ආඥාවයි

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම, විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද පහත සඳහන් උප ලේඛනයේ විස්තර කර ඇත්තාවූද ඉඩම, අත්පත් කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග ඇමති.

යොමු අංකය : පීඊ 13/70 (43), සීඊසීඩබ්/එල්ඒ/8.

1975. 03. 14 දින, කොළඹදීය.

#### උප ලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මාකොල ගමේ පිහිටි කොස්ගහවත්ත නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ 0, පර්චස් 6 ක් පමණවූ ඉඩම් කොටස් 1 ට මායිම් :—

උතුරට : මාකොල-උඩුපිල මහා මාර්ගය.
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස.
බටහිරට : කරත්ත පාර.

හිමිකම් කියන අය : ඩී. ආර්. පී. කරුණාරත්න මයා,
මාවරමණ්ඩිය, මාකොල,
සියබලාපේ.

4–103—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සී/අයි. 112.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය, 457, යූනියන් පෙදෙස, කොළඹ 2 සහ ලිවර් බ්‍රදර්ස් (සිලෝන්) ලිමිටඩ්, 258, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) ප්‍රඥප්ති ඇතුළු කිරීමා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 5, ගවර් වීදියේ අංක 26 දරණ ස්ථානයේ පදිංචි නිව්ටන් එදිරිසිංහ මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද සොයිසා. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1975 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය,
457,
යුනියන් පෙදෙස,
කොළඹ 2

සහ

ලිවර් බ්‍රදර්ස් (සිලෝන්) ලිමිටඩ්,
258,
ග්‍රෑන්ඩ්පාස් පාර,
කොළඹ 14

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශනය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ, ලිවර් බ්‍රදර්ස් (සිලෝන්) ලිමිටඩ්හි සේවයෙහි යොදවා ඇති සාප්පු හා කාර්යාල සේවක පනතේ ප්‍රතිපාදනවලින් ආවරණය වන තම සාමාජිකයන්ට 1966-1971 අතර කාලපරිච්ඡේදය තුළ, පෙර පෝය හා පෝය දිනවලදී වැඩ කිරීම වෙනුවෙන් ද්විත්ව වේතනයන්ට අමතරව සතියකට පැය 38 විනාඩි 20 ක් ඉක්මවා කරන ලද සේවය වෙනුවෙන්, පැයකට ගෙවීම මෙන් 1 1/2 ප්‍රමාණයක් අතිකාල දීමනා වශයෙන් ලිවර් බ්‍රදර්ස් (සිලෝන්) ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් ගෙවන ලෙසට සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය විසින් කර ඇති ඉල්ලීම යුක්ති සහගතද යන්න හා ඔවුන්ට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳව වේ.

1975 මාර්තු මස 6 වැනිදා වූ මෙදින කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

4-63—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

අංක : ඩබ්. 105/79.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත ආඥාපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරණ (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 1975 ජනවාරි මස 17 වැනි අංක 147 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලද 1975 ජනවාරි මස 02 වන දින දරණ නියෝගයෙන් ලංකා වතු සේවා සංගමය, 13, කන්දේ වීදිය, මහනුවර සහ කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 148හි ගෝර්ඩන් ෆ්‍රේසර් ඈන්ඩ් කම්පැනි ලිමිටඩ් බාරේ, බදුල්ල කීනකැලේ වත්තේ අයිතිකරුවන් වන රාජවැල්ල ප්‍රොඩියුස් කම්පැනි ලිමිටඩ් අතර ඇති 1974 දෙසැම්බර් මස 24 දින දරණ ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා ඒ. එම්. එම්. නසීර් වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයයි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1975 ජනවාරි මස 02 දින දරණ නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද සොයිසා. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දීය.

4-64/1—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංක : ඩබ්. 105/79.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ලංකා වතු සේවා සංගමය, 13, කන්දේ වීදිය, මහනුවර සහ කොළඹ 2, වොක්ෂෝල් වීදියේ, අංක 148හි ගෝර්ඩන් ෆ්‍රේසර් ඈන්ඩ් කොම්පැනි ලිමිටඩ් බාරේ බදුල්ලේ කීනකැලේ වත්තේ අයිතිකරුවන් වන රාජවැල්ල ප්‍රොඩියුස් කොම්පැනි ලිමිටඩ් අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 7, වෝඩ් පෙදෙසේ අංක 54 දරණ ස්ථානයේ පදිංචි වී. සුප්පයියා මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද සොයිසා. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1975 මාර්තු මස 17 දින,
කොළඹ දීය.

---

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

ලංකා වතු සේවා සංගමය,
අංක 13, කන්දේ වීදිය, මහනුවර

සහ

කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 148 හි ගෝර්ඩන් ෆ්‍රේසර් ඈන්ඩ් කොම්පැනි ලිමිටඩ් බාරේ, බදුල්ලේ කීනකැලේ වත්තේ අයිතිකරුවන් වන රාජවැල්ල ප්‍රොඩියුස් කොම්පැනි ලිමිටඩ්.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශනය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ බදුල්ලේ කීනකැලේ වත්තේ එකී පාලක පක්ෂය විසින් කේ. ඈම්. මහේන්ද්‍රන් මහතා සේවයෙහි නොයෙදවීම යුක්ති සහගතද යන්න හා ඔහුට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳව වේ.

1975 පෙබරවාරි මස 28 වැනිදා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

4-64/2—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

අංක : පී 23/කො. 384/74

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කරන ලද 1975 පෙබරවාරි මස 19 වන දින දරන නියෝගයෙන් සී. එම්. අබේසේකර මහතා, 30/28, ලොන්ඩන් පෙදෙස, කොළඹ 7 සහ සී/ස. විටෝල්ස් එස්ටේට්ස් ඇන්ඩ් ඒජන්සීස් ලිමිටඩ්, 148, වොක්ෂෝල් වීදිය, කොළඹ 2, අතර ඇති 1975 පෙබරවාරි මස 13 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා අංක 26, ගවර් වීදියේ, කොළඹ 5, දරන ස්ථානයේ පදිංචි, නිව්ටන් එදිරිසිංහ මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරනු අතර, එකී 1975 පෙබරවාරි මස 19 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1975 මාර්තු මස 19 දින,
කොළඹ දීය.

4-58/1—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

අංකය : පී 23/කො. 384/74.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව සී. එම්. අබේසේකර මහතා, 30/28, ලොන්ඩන් පෙදෙස, කොළඹ 7 සහ සී/ස. විටෝල්ස් එස්ටේට්ස් ඇන්ඩ් ඒජන්සීස් ලිමිටඩ්, 148, වොක්ෂෝල් වීදිය, කොළඹ 2 අතර කාර්මික ආරවුල් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 5, ගවර් වීදියේ, අංක 26 දරන ස්ථානයේ පදිංචි නිව්ටන් එදිරිසිංහ මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1975 මාර්තු මස 19 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය—කාර්මික ආරවුල් පනත**

සී. එම්. අබේසේකර මහතා, 30/28, ලොන්ඩන් පෙදෙස, කොළඹ 7
සහ
සී./ස. විටෝල්ස් එස්ටේට්ස් ඇන්ඩ් ඒජන්සීස් ලිමිටඩ්, 148 වොක්ෂෝල් වීදිය, කොළඹ 2

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශනය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ කොළඹ 2, විටෝල්ස් එස්ටේට්ස් ඇන්ඩ් ඒජන්සීස් ලිමිටඩ් විසින් සී. එම්. අබේසේකර මහතාගේ සේවය අවසන් කිරීම යුක්ති සහගතද යන්න සහ ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1975 මාර්තු මස 19 වැනිදා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දිනා යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද' මැල්,
කම්කරු කොමසාරිස්.

4-58/2—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : සී/අයි. 14

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(2) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය කම්කරු කොමසාරිස්වරයාගේ අනුබද්ධිත ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා වෙළඳ සේවක සංගමය, 22 1/1, ඉහළ චැතම් වීදිය, කොළඹ 1. සහ මිලර්ස් ලිමිටඩ්, 50, යෝර්ක් වීදිය, කොළඹ 1. අතර කාර්මික ආරවුලක් පවතී.

කම්කරු ඇමති, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14, අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(2) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල නිරවුල් කිරීම සඳහා එම පනතේ 22 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන්නාවූ කාර්මික අධිකරණයක් වෙත යොමු කරමි.

ඇම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1975 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය—කාර්මික ආරවුල් පනත**

ලංකා වෙළඳ සේවක සංගමය,
22 1/1, ඉහළ චැතැම් වීදිය, කොළඹ 1.
සහ
මිලර්ස් ලිමිටඩ්,
50, යෝර්ක් වීදිය, කොළඹ 1.

අතර පවතින කාර්මික ආරවුක් පිළිබඳවයි.

ආරවුලට හේතුවී පවත්නා කරුණු පිළිබඳ ප්‍රකාශනය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ කොළඹ මිලර්ස් ලිමිටඩ් හි සේවයෙහි යොදවා ඇති තම සාමාජිකයන් වෙනුවෙන් ලංකා වෙළඳ සේවක සංගමය විසින් කරන පහත සඳහන් ඉල්ලීම් යුක්තිසහගතද යන්න හා ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳව වේ.

1. මිලර්ස් ලිමිටඩ් හි සේවකයන්ට කාර්ගිල්ස් ලිමිටඩ් හි වැටුප් පරිමාව අදාල විය යුතුය.

2. කාර්ගිල්ස් ලිමිටඩ්හි සේවකයන්ට සපයන්නාක් මෙන් මිලර්ස් ලිමිටඩ්හි සේවකයන්ට සහන මිලට දිවා, ආහාර සැපයිය යුතුය.

3. කාර්ගිල්ස් ලිමිටඩ්හි සේවකයන්ට ප්‍රදානය කර ඇති පරිදි, පිරිවැය මිලට සමාගමෙන් බඩු මිලදී ගැනීමේ පහසුව මිලර්ස් ලිමිටඩ්හි සේවකයන්ට ලබාදිය යුතුය.

1975 මාර්තු මස 6 වැනිදා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දිනා යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

4-57—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 118 (I) සහ 120 (2) වගන්ති සමග කියවෙන 119 (1) සහ 120 (3) වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග ඇමති මෛත්‍රීපාල සේනානායක වන මම මෙහි පහත දක්වෙන උපලේඛනයේ I වන තීරුවේ නිශ්වය කොට දක්වා ඇති බලතල එහි II වන තීරුවේ නිශ්වය කොට ඇති දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් එහි III වන තීරුවේ නිශ්වය කොට දක්වා ඇති රාජ්‍ය නිලධාරීන් වෙත පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මෙයින් පවරා දෙමි.

(i) එබඳු බලතල දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සාමාන්‍ය නියමයන් යටතේ හා ශ්‍රී ලංකා ජනරජ ආණ්ඩුවේ ආයතන සංග්‍රහයේ නියම කොට ඇත්තාවූ කාර්යය පරිපාටියට සහ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ මා විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි වෙනයම් හෝ වැඩිදුර උපදෙස්වලට ද අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

(ii) යම්බඳු රාජ්‍ය නිලධාරියකුට පවරා දෙනු ලැබූ යම්බඳු දඬුවම් කිරීමේ හෝ මාරුකිරීමේ බලතල මා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) හා 120 (3) වැනි වගන්ති ප්‍රකාරව මා විසින් තීරණය කරනු ලැබූ කිසියම් කාරණයක් සම්බන්ධව සේවයෙන් පහකිරීමේ හෝ වෙනත් ආකාරයකින් දඬුවම් කිරීමේ හෝ මාරු කිරීමේ හෝ කිසියම් බලතලයක් රාජ්‍ය නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කරනු නොලැබිය යුතුය.

## උපලේඛනය

| I වන තීරුව | II වන තීරුව | III වන තීරුව |
|---|---|---|
| (1) වාර්ෂික ආරම්භක වැටුප රු. 6,720 ට අඩු ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමි (ඒකාබද්ධ සේවාවන් කිසිවකට අයත් නිලධාරියෙකු හැර) රාජ්‍ය නිලධාරියෙකුගේ වැඩ තහනම් කිරීම, සේවයෙන් පහකිරීම හෝ වෙනයම් කිසි දඬුවමක් පැනවීමේ බලය | වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශ කාර්යාලය<br>ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය හැර අමාත්‍යාංශය යටතේ ඇති අනිකුත් දෙපාර්තමේන්තු | ලේකම්,<br>අතිරේක ලේකම්<br>දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| | ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය ... | වැඩ අධ්‍යක්ෂ |
| (2) වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 5,160 ට අඩු රාජ්‍ය නිලධාරියකු සම්බන්ධයෙන් (ඒකාබද්ධ සේවාවන් කිසිවකට අයත් නිලධාරියෙකු හැර) අපවාද කිරීම තරවටු කිරීම හෝ තදින් තරවටු කිරීම හෝ සතියක වැටුපට නොවැඩි දඩයක් ගැසීම හෝ වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා වැටුප් වර්ධකය අත්හිටු වීම නතර කිරීම අඩු කිරීම හෝ විලම්භනය කිරීම හෝ කවර වූ හෝ කරුණක් සම්බන්ධයෙන් වෙනත් පිළිගත් දෙපාර්තමේන්තුමය සුළු දඬුවමක් පැනවීමේ බලය | වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශ කාර්යාලය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>සේවක පාලන හා කර්මාන්ත සම්බන්ධතා අධ්‍යක්ෂ<br>සහකාර ලේකම්වරුන් |
| | වාරිමාර්ග ... ... ... | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ (පාලන)<br>පාලන නිළධාරී/පාලන සහකාර<br>ගණකාධිකාරී<br>ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු<br>වාරිමාර්ග ඉංජිනේරු<br>විශේෂඥ නිලධාරී<br>යාන්ත්‍රික ඉංජිනේරු<br>පාංශු පරිශීලන අංශයේ ප්‍රධානියා |
| | ඉඩම් සංවර්ධන ... ... | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| | මහාමාර්ග ... ... ... | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>ප්‍රධාන ඉංජිනේරු<br>සහකාර අධ්‍යක්ෂ (පාලන) |
| | යන්ත්‍රෝපකරණ ... ... | සහකාර අධ්‍යක්ෂ<br>පාලන සහකාර/කාර්යාල සහකාර<br>ගණකාධිකාරී<br>යාන්ත්‍රික ඉංජිනේරු |
| | රජයේ කර්මාන්ත ශාලාව ... ... | අධිකාරී ඉංජිනේරු<br>පාලන නිලධාරී<br>වැඩපළ කළමනාකරු |
| | ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය ... | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ<br>අධිකාරී ඉංජිනේරු<br>විධායක ඉංජිනේරු<br>පාලන නිලධාරී |
| (3) අමාත්‍යාංශය තුල ස්ථාන මාරු කිරීමේ බලය ... | වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශ කාර්යාලය හා ඒ යටතේ ඇති අනිකුත් දෙපාර්තමේන්තු | ලේකම්<br>අතිරේක ලේකම්<br>සහකාර ලේකම් (පාලන) |
| | ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය ... | සහකාර ලේකම් (ප්‍රාදේශීය–ආයතන) |
| (4) දෙපාර්තමේන්තුව තුල ස්ථාන මාරු කිරීමේ බලය ... | අමාත්‍යාංශය යටතේ ඇති අනිකුත් දෙපාර්තමේන්තු | දෙපාර්තමේන්තු ප්‍රධානියා<br>නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියා<br>සහකාර දෙපාර්තමේන්තු ප්‍රධානියා<br>පාලන නිලධාරී |
| (5) ඒකාබද්ධ සේවාවන් කිසිවකට අයත් නිලධාරීන් හැර අනිකුත් නිලධාරීන් දිසාව තුළ ස්ථාන මාරුකිරීමේ බලය | ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය ... | වැඩ අධ්‍යක්ෂ |

මෛත්‍රීපාල සේනානායක
වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග ඇමති

වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශය,
කොළඹ 1.
1975 මාර්තු මස 03 දින.

4–95—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

# මිල පාලන දැන්වීම්

පී.ඇල්. 1/75 දරණ ආහාර මිළ නියෝගය — තිරිඟු පිටි

## මිළ පාලන පනත

## නියෝගය

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත්, සමරසිංහගේ විමල්සිරි අතුල වන මම (173 අධිකාරය වන) මිළ පාලන පණතේ 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව —

(i) 1974.09.20 වෙනි දින අංක 130 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1974.09.09 වෙනි දින අංක පී.ඇල්. 2/74 දරණ ආහාර මිළ නියෝගය, මේ දින් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) මීට යාකර ඇති උප ලේඛණයේ 2 වෙනි තීරයේ සඳහන් වී ඇති මිළ ගණන්, මේ දින් සිට එම උප ලේඛණයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශය තුළ තිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 112 ක ප්‍රමාණයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම තොග මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) මීට යාකර ඇති උප ලේඛණයේ 3 වන තීරයේ සඳහන් වී ඇති මිළ ගණන්, මේ දින් සිට එම උප ලේඛණයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශය තුල තිරිඟු පිටි ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා :—

(අ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීමක් හෝ තිරිඟු පිටි වරකට ශුද්ධ බර රාත්තල් 112 ක ප්‍රමාණයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස තිරිඟු පිටි ශුද්ධ බර රාත්තල් 112 කට අඩුව විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ඇ) තිරිඟු පිටි හා ඉරිඟු පිටි එකට මිශ්‍ර කළ විට,එය ''තිරිඟු පිටි'' නමින් හැඟවෙන බවත් මෙම නියෝගයෙන් නියම් කරමි ;

(ඈ) තිරිඟු පිටි තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් 112 කට අඩු හෝ වැඩි ඕනෑම ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර රාත්තල් 112 ක් තොග වශයෙන් විකිණිය යුතු වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළ අනුව බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(v) තවද, තිරිඟු පිටි, ඉරිඟු පිටි හැර වෙන කිසියම් ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද, මෙම නියෝගයෙන් නියම් කරමි.

(vi) තවද, බරින් සියයට 10 කට වැඩියෙන් ඉරිඟු පිටි මිශ්‍ර කරන ලද තිරිඟු පිටි කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(vii) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සැම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක හෝ තිරිඟු පිටි සිය ස්වාමිත්වය යටතේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සැම වෙළෙන්දෙකුම තිරිඟු පිටි ප්‍රමාණයක් සුදුසු භාජනයක තබා එම ආහාර ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට එම තිරිඟු පිටි සහ එම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බවද නියම කරමි.

(viii) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල'' නොහොත් ''රා'' යන්නෙන් අදහස් කරනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව, සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(ix) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සැම ප්‍රදේශයකම තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් තිරිඟු පිටි විකුණන සැම තැනැත්තෙකුම විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ තිරිඟු පිටිවල ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ තිරිඟු පිටි සඳහා ගෙවූ මුදල; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(x) තවද, තිරිඟු පිටි විකිණීමේදී එම තිරිඟු පිටි යම්කිසි දෙයක ඔතනු ලැබෙනම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් එම නියෝගයෙන් නියම කරනු ලැබූ වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වන බවද නියම කරමි.

1975 පෙබරවාරි මස 28 වෙනි දින පෙ.ව. 10 ට පොලොන්නරුව දිසාපති කාර්යාලයේදී අත්සන් කරන ලදී.

එස්. ඩබ්ලිව්. අතුල,
සහකාර මිළ (ආහාර) පාලක,
පොලොන්නරුව දිස්ත්‍රික්කය.

### 1 වෙනි උපලේඛනය—සළාක පිටි

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | ශුද්ධ බර රා.112ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කය | 119 58 ... | 1 12 |

### 2 වෙනි උපලේඛනය—සළාකයෙන් බැහැර පිටි

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | ශුද්ධ බර රා. 112ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කය | 123 90 ... | 1 12 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි නියමිත මිළ නොවේ. මේවා ඉහත සඳහන් ද්‍රව්‍යයන්ගේ උපරිම මිළ ගණන් වේ. මේ ද්‍රව්‍ය මේ මිළට ඉහළින් විකිණීම නොකළ යුතුයි.

4-54—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## දුම්රිය හරස් මග අලුත්වැඩියා කිරීම—මාතලේ මාර්ගය

මාතලේ දුම්රිය මාර්ගයේ, පොරාදෙනිය හා නුවර අසල දුම්රිය ස්ථාන අතර සැ. 3 ද. 44 දරණ ස්ථානයේ පිහිටි [illegible] නුවර දෙසියත්තේවෙල කරත්ත පාර හරහා වැටී ඇති දුම්රිය හරස් මාර්ගය, 1975.04.26 වැනි දින පැය 18.00 සිට 1975.04.27 වැනි දින පැය 06.00 දක්වා අලුත්වැඩියා කරනු ලැබේ.

මෙම මාර්ගය රථවාහන ගමනා ගමනය සඳහා 1975.04.26 වැනි දින පැය 18.00 සිට පැය 22.00 දක්වාද, 1975.04.27 වැනි දින පැය 04.00 සිට පැය 06 දක්වාද අර්ධ වශයෙන් වසා තබනු ලැබේ. මෙම කාලය තුළදී රථ වාහනවලට මෙම හරස් මාර්ගය මගින් ගමන් කිරීමට කටයුතු සලසනු ලැබේ.

මෙම මාර්ගය රථ වාහන ගමනා ගමනය සඳහා 1975.04.26 වැනි දින පැය 22 සිට 1975.04.27 වැනි දින පැය 04.00 දක්වා සම්පූර්ණයෙන්ම වසා තබනු ලැබේ. මෙම කාලය තුළදී සියලුම රථ වාහන නුවර-කොළඹ මහා මාර්ගයේ ගමන් කර සුදුහුම්පොල පිහිටි දුම්රිය හරස් මාර්ගය හරහා ගමන් කළ යුතුයි.

එස්. අමරසූරිය,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

4-12—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය හරස් මග අලුත්වැඩියා කිරීම

ප්‍රධාන දුම්රිය මාර්ගයේ හැටන් සහ කොටගල දුම්රිය ස්ථාන අතර සැ. 111, ද. 01හි හා හැටන්-තලවාකැලේ මහා මාර්ගයේ සැ. 86, ද. 02 දරණ ස්ථානයේ පිහිටි දුම්රිය හරස් මාර්ගය, 1975.05.03 වැනි දින පැය 18.00 සිට 1975.05.04 වැනි දින පැය 06.00 දක්වා අලුත්වැඩියා කරනු ලැබේ.

මෙම මාර්ගය රථවාහන ගමනාගමනය සඳහා අර්ධ වශයෙන් 1975.05.03 වැනි දින පැය 18.00 සිට පැය 22.00 දක්වා ද, සම්පූර්ණ වශයෙන් 1975.05.03 වැනි දින පැය 22 සිට 1975.05.04 වැනි දින පැය 06.00 දක්වා ද වසා තබනු ලැබේ.

ඉතාමත් හදිසි වාහන පමණක්, මෙම මාර්ගය සම්පූර්ණ වශයෙන් වසා තබන කාල සීමාව තුළදී ගමන් කරවීමට කටයුතු කරනු ලබනුයේ වෙනත් මාර්ගයක් නොමැති නිසාය.

එස්. අමරසූරිය,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

4-13—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය හරස් මග අළුත්වැඩියා කිරීම

උතුරු දුම්රිය මාර්ගයේ මාන්කුලම අංගනයේ සැ. 185 ද. 46 පු. 47 යන ස්ථානයේ පිහිටි දුම්රිය හරස්මඟ 1975.04.29 දින සවස 4.30 සිට 1975.04.30 දින පෙරවරු 7.00 දක්වා අළුත්වැඩියා කිරීම පිණිස වසා තබනු ලැබේ.

අළුත්වැඩියා කරණ කාලය තුළදී එම ස්ථානයේ පිහිටි තාවකාලික දුම්රිය හරස් මගක් මස්සේ මාර්ග වාහන යැවීමට කටයුතු කරනු ඇත.

එස්. අමරසූරිය,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

4-39—75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

---

### කළුතර දිස්ත්‍රික්කයේ බදුරලිය සංචාරක බංගලාව, තානායම් තත්ත්වයට උසස් කිරීම

කළුතර දිස්ත්‍රික්කයේ බදුරලිය සංචාරක බංගලාව 75. 04. 05 වැනි දින සිට තානායම් තත්ත්වයට උසස් කෙරෙන බැව් මහජනයාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. ජී. පුංචිහේවා,
කළුතර ආණ්ඩුවේ ඒජන්ත.

දිසාපති කාර්යාලය,
කළුතර,
1975. 03.21 දින.

4-41— 75.04.04 දින අංක 158 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වෙලාවන් පෙරවරු 8 සිට පස්වරු 4.15 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 8.30 සිට පස්වරු 2.45 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන්, කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1968.12.10 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... ... | 43 | 50 | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 60 | 0 | 15 |

දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම් සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

### 1975

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 75.03.07 | සිකුරාද ... | 75.02.28 | සිකුරාද | දවල් 12.00 |
| | 75.03.14 | සිකුරාද ... | 75.03.07 | සිකුරාද | දවල් 12.00 |
| | 75.03.21 | සිකුරාද ... | 75.03.14 | සිකුරාද | දවල් 12.00 |
| | 75.03.27 | බ්‍රහස්පතින්ද ... | 75.03.21 | සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් ... | 75.04.04 | සිකුරාද ... | 75.03.27 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 75.04.11 | සිකුරාද ... | 75.04.04 | සිකුරාද | දවල් 12.00 |
| | 75.04.18 | සිකුරාද ... | 75.04.11 | සිකුරාද | දවල් 12.00 |
| | 75.04.24 | බ්‍රහස්පතින්ද ... | 75.04.18 | සිකුරාද | දවල් 12.00 |
| මැයි ... | 75.05.02 | සිකුරාද ... | 75.04.24 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 75.05.09 | සිකුරාද ... | 75.05.02 | සිකුරාද | දවල් 12.00 |
| | 75.05.16 | සිකුරාද ... | 75.05.09 | සිකුරාද | දවල් 12.00 |
| | 75.05.23 | සිකුරාද ... | 75.05.16 | සිකුරාද | දවල් 12.00 |
| | 75.05.30 | සිකුරාද ... | 75.05.23 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි ... | 75.06.06 | සිකුරාද ... | 75.05.30 | සිකුරාද | දවල් 12.00 |
| | 75.06.13 | සිකුරාද .. | 75.06.06 | සිකුරාද | දවල් 12.00 |
| | 75.06.20 | සිකුරාද ... | 75.06.13 | සිකුරාද | දවල් 12.00 |
| | 75.06.27 | සිකුරාද ... | 75.06.20 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී